# මාරසීන්

"සීත සුළං අවට හමන්නේ - සුදු වලාකුලයි කන්දෙ හැපෙන්නේ ....
වව්නියාවෙ යන්න - පොඩි විවේකයක් ගන්න - ඇගේ පතේ සුවය දනෙන්න....."

චූටි දුම් වැටියක් උරමින් දුම්රිය මැදිරියේ පාපුවරුවේ වාඩි වී ගීතයක් මුමුණයි. දුම්රිය වේගයෙන් ඇදෙයි. වව්නියාවේ අනාථ කඳවුරකට යැමට අපි තීරණය කළේ කොළඹ ජීවත් වීමට බැරි නිසාය. යෝජනා ස්ථිර කිරීම් බිරිඳ හා නැන්දම්මාගේ ය.

".....දැන් ඉතිං අපිට ආයෙත් දුක් විඳින්න වෙන්නෙ නෑ... පුතේ..."  කියමින් බිරිඳ සිලි සිලි බෑගයේ තිබූ රෝස් පාන් කෑල්ල පුතාට දුන්නාය.

"....එහේ ගිය හැටියෙම දොස්තරට පෙන්නල කොළුවට පණු බෙහෙත් ටිකක් ඉල්ලල දෙන්න මතක තියාගනිං...." නැන්දම්මා ඔවදනක් දුන්නා ය.

"...එහේ කෑම, බීම, නෑම, බෙහෙත් හේත්, වතුර, විදුලිය, සබ්බ සකළමනාවම තියෙනවලු..."

"....මට නං ඕව දකින කං විශ්වාස නෑ...." මම කීවෙමි.

"....ඉතිං ඔයාට තිබුණේ ගිහින් හොයල බලන්න. ..."

"....ඒකනේ මම තනියෙන් වව්නියාවේ යන්නං කියල කිව්වේ...."

"....ගියා නං හොඳට හිටී.... ඔහේ අල්ලන්න මට දල් දාන්න වේවි.... කොටි හින්ද කන්න නැතුව වේලි වේලි පං ගස් වගේ හිටපු ගෑණු කඳවුරට ඇවිල්ල සුමාන දෙක යනකොට පිපිඤ්ඤා සයිස් එකට මහත් වෙලා දැන් ඉටි රූප වගේ බබලනවලු....."

"....ළඟදි තියෙන සාහිත්‍ය උත්සවේ රූප රැජිනි තරගයට ඉදිරිපත් වෙන්න ඒ ගොල්ල දැන්ම හිටං යමරෙට පොරකනවලු...."

".....ඒකට අපි? කන්න අඳින්න මොනතරං දුක් විඳිනවද? බඩගින්නෙ හරි වැටිල බුදියගන්න නිදහසක් තිබුණද? ඔක්කොම එක ගොඩේ ඌරු කොටුව වගේ.... පොඩි එකාට ඉස්කෝලයක් හොයා ගන්න නැහුන හැටි උඩ ඉන්න දෙයියොයි මායි විතරයි දන්නේ......දරු පැටියගේ තනියට මල්ලි කෙනෙක් හරි නංගියෙක් හරි ගේන්න කියල කාලයක් තිස්සේ කියනව.."

".....ඉතිං ඒකට මං මොනව කරන්නද?....." මම කේන්තියෙන් ශබ්ද නගා කීවේ නැන්දම්මාට දැන ගන්නටත් එක්ක ය.

"....ඒ හින්ද තමයි මනුස්සයෝ වව්නියාවේ අනාථ කඳවුරකට හරි ගිහිල්ලා ඉඳිමු කිව්වේ. එතකොට මේ කරදර ඔක්කකොම ඉවරයි. ආණ්ඩුවට පිං සිදු වෙන්න......." ඕ සුසුමක් හෙළුවාය. දුම්රිය මැදවච්චියේ නවත්වන ලදි.

".....මේක වව්නියාවට යන්නේ නැද්ද?....." චූටි වටපිට බලා ඇසුවේය.

"....ඉස්සර ගියා මල්ලි.... දැන් වව්නියාවේ අනාථ කඳවුර මැදවච්චිය වෙනකම් ලොකු කරන්න යන හින්ද කෝච්චිය වව්නියාවට යන්නේ නෑ....." දුම්රිය සේවකයෙක් කීය.

අපි දුම්රියෙන් බැස ගත්තෙමු. අපට පාර කියා දීමට ආවේ දෙමළ ජාතික මගියෙකි. හැරමිටි වාරුවෙන් ගිය ඔහුගේ අතේ කබල් සූට්කේස් එකක් විය.

".....අයියත් අසනීපෙන් වගේ...." මගේ බිරිඳ ඔහුට කීවාය.

"....ඕව් තංගච්චි... ඩයබිටිස්.... මේ බලන්න, ඇඟිලි කපලා. කකුලත් කැපුවා. ඇඟ ඔක්තොම තුවාල...."

"....ඩයබිටිස් හැදුනාම ඕම තමයි....." චූටිද එකතු විය.

"....කවුද ලෙඩේ හොයා ගත්තේ?....." මම ඇසුවෙමි.

".....ඩොක්ටර් ගෝලීය රඹුටන්වල්ල....මට මේ ලෙඩේ තියෙනව කියල දැක්කේ ලේක්හවුෂ් පත්තරේ කියවන කොට. ඊට පස්සේ මම බේත් ගන්න මැලේෂියාවට ගියා.....දෙං ආරංචියි ලෝකේ කොහේවත් බේත් නෑ, වව්නියාවේ රිපියුජී කෑම්ප් එකේ විතරයි තියෙන්නේ කියලා....." මගියා කීය.

".....අපේ එක්කෙනාගෙත් ඇට ටික විතරයි, මේ අයිය බේත් ගන්න තැනකින් ඔයත් විටමින් ටිකක් ඉල්ල ගන්න....." බිරිඳ මට කීවාය.

ඒත් මගියාගේ විලාසය මට නං ඇල්ලුවේ නැත. සැකයක් ම සිත පෙළයි.

".....ඔයා ප්‍රභාකරන් නේද?...." මම ඉවසිය නොහෙන තැන ඇසුවෙමි.

".....ඔවු අයියා, ..කොහොම අඳුන ගත්තද මාව. පුදුමයි අප්පා....."

"....මට අඳුන ගන්නත් බෑ. කොහොම තිබුණ සරීරෙද....? කෝ.... මදිවදිනි.....?"

"....එයා රිපියුජී කෑම්ප් එකේ...."

".....පුතා චාර්ල්ස් ඇන්ටනි....?"

"....එයත් කෑම්ප් එකේ..."

"....එතකොට පොට්ටු අම්මාන්?...."

".....එයත් අනාථ කඳවුරේ...."

"....එතකොට ඇඩෙලා බාලසිංහම්?....."

"....ඕෂ්ට්‍රේලියාවේ ඉඳලා එයත් කඳවුරට ආව. කඳවුරේ පැෂිලිටීස් ඕෂ්ට්‍රේලියාවට වැඩිය ඔඳ හින්ද. ළඟදී ඉඳලා තමිල්නාඩුවේ මිනිෂ්ෂුයි, කැනඩාවේ, ජර්මනියේ, එංගලන්තේ ඔක්කොම එන්න පටන් අරන්......"

".....අයියා සිංහල මිනිස්සුන්ගෙන් ඕගොල්ලන්ට කරදරයක් නැද්ද?...."

".....පිෂ්ෂුද මල්ලි? එළ උරුමෙ උපාෂක මැඩම්ලා, උපාෂක සර්ලා ලොකු කාර්වලින් ඇවිල්ල අම්මල-අප්පල නැති පොඩි එවුන් උෂ්ෂල උම්ම එක දීල කොළඹ බංගලාවලට ගෙනියනවා දරුකමට හදා ගන්න. උගන්නන්න.... අප්පා රත්තරං ආමිනේල....." ප්‍රභා ගෞරවයෙන් කීය.

".....ඒයි මළ කෙළියයි....." චූටි කඳවුර දෙස සිට දුවගෙන ආවේය.

".....අනාථ කඳවුර හවුස්ෆුල්, ඉඩ නැතිලූ....."

".....අයියෝ අපි ඉවරයි... ජින්තුපිටියේ තිබුණු කුළී ගේත් බාරදීල අපි ආවේ. අපිට දැන් කාගේ පිහිටක්ද?.....?" නැන්දම්මා ළතෝනි දුන්නාය.

".....දෑං ඉතිං පුතේ පුතාගෙ පිහිට විතරයි, ප්‍රභා පුතේ....."

"....අඬන්න එපා... අම්මා. මම ළඟ දී කොළඹ පැත්තෙන් ඕගොල්ලන්ට ඔඳට ඉන්න අනාථ කඳවුරු දෙක තුනක් දාලා දෙනවා... අඬන්න එපා....."

"මගෙ පුතාට පුල්ලෙයාර්දෙයියන්ගේ පිහිටයි, ජයසරිමහ හාමුදුරුවන්ගෙ වීහිටයි!" කියමින් නැහයේ හොටු සාරි පොටින් පිසදා ගත්තාය.

".....අංකල් මට නංගියෙකුත් අම්මා ගේන හින්ද කාඹර දෙකක් අපට දෙන්න......" පුතා කියද්දී ප්‍රභා හැරමිටිය පසෙක තබා පුතාගේ හිස අතගෑවේය.